**යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය - 2020**

---

යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3706 - එස්ආර්අයි (සීඕඑල්) දරන ණය ගිවිසුමේ VI ව්‍යාස්ථාවේ 4.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 09 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ ප්‍රමුඛතා නාගරික ව්‍යාපෘති සඳහා ඉහළ මට්ටමේ සූදානමක් ඇති කරගැනීම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,879 කට සමාන එජඩො මිලියන 12.20 ක් වන අතර ඉන් රු.මිලියන 1,540කට සමාන එජඩො මිලියන 10ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 338.85කට සමාන එජඩො මිලියන 12.20ක් ශ්‍රී ලංකා රජය මූල්‍යානය කරනු ලැබේ. ඉන් රු.මිලියන 884කට සමාන එජඩො මිලියන 5.74ක් පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන්කර තිබුණු අතර ඉතිරි මුදල වන රු.මිලියන 995කට සමාන එජඩො 6.46ක් මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත වෙන්කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජුනි 01 දින ආරම්භ කර තිබුණු අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 02 වගුවේ දැක්වෙන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ද්විතීක නගර තිරසාර සංවර්ධන ව්‍යාපෘතිය, ව්‍යාපෘති ක්‍රියාවලි ලැයිස්තුවෙන් ඉවත් කිරීම හේතුවෙන් යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය අර්ධ වශයෙන් නිමකර අවසන් කර තිබුණි. කෙසේවෙතත්, පළාත් පාලන ආයතන 25ක නාගරික පහසුකම් පිළිබඳ විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව නිම කිරීමකින් තොරව 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 176.36ක සංවර්ධන වියදමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් ලෙස දක්වා තිබුණි. | 176.36 | අදහස් දක්වා නොමැත | නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සැලසුම් උපදේශකවරුන් විසින් භාවිතා කරන ලද මිලදී ගත් ඡායා පිටපත් යන්ත්‍ර 06ක් හා පරිගණක 06ක් වර්ෂය අවසානයේදී රේඛීය අමාත්‍යාංශයට භාරදී තිබුණ ද, මූල්‍ය ප්‍රකාශනවල සංවර්ධන වියදම් යටතේ එම වත්කම්වල වටිනාකම දක්වා තිබුණි. | 3.65 | අදහස් දක්වා නොමැත | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ද්විතීක නගර තිරසාර සංවර්ධන ව්‍යාපෘතිය ව්‍යාපෘති ක්‍රියාවලි ලැයිස්තුවෙන් ඉවත් කිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය ඇවර කර තිබුණ ද, අඛණ්ඩ පැවැත්ම සංකල්පය පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | - | අදහස් දක්වා නොමැත | ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමෙන් පසු ඇවර කිරීමේ ගිණුම් පිළියෙල කළ යුතුය. |

## 2.2 නීතිරීති රෙගුලාසි සමග අනුකූල නොවීම

| | නීතිරීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් වාර 01 ක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමට අවශ්‍ය වේ. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | එ.ජ.ඩො මිලියන 5ක පිරිවැය සහිත ව්‍යාපෘතියක සේවයේ නියුතු ව්‍යාපෘති අධ්‍යක්ෂක සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ සඳහන් ප්‍රතිපාදන වලට පටහැනිව මාසික වැටුප රු.60,000ක් වන එකතුව රු.960,000ක් ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත ගෙවා තිබුණි. | වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වැඩි දුර අධ්‍යානයට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීමට අවශ්‍ය අතර වැඩිපුර කරන ලද ගෙවීම් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව පුරනැගුම ව්‍යාපෘතියේ මූල්‍ය විශ්ලේශක මෙම ව්‍යාපෘතියේ වැඩ බලන පදනම යටතේ ගණකාධිකාරී ලෙස පත්කර එකතුව රු.මිලියන 675,000ක් ගෙවා තිබුණි. | මෙම නිලධාරියා ව්‍යාපෘතියේ දෛනික කටයුතු කරගෙන යාමට තාවකාලික පදනමින් සේවයේ යොදවා ඇත. වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වැඩි දුර අධ්‍යයනයට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීමට අවශ්‍ය අතර වැඩිපුර කරන ලද ගෙවීම් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 ජනවාරි 12 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | විගණන හා කළමනාකරණ රැස්වීම් නියමිත පරිදි පැවැත්වීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | රටේ පවතින ණය සහ මූල්‍ය අවකාශය හේතුවෙන් රජය විසින් ද්විතීක නගර තිරසාර සංවර්ධන ව්‍යාපෘතිය ව්‍යාපෘති ක්‍රියාවලි ලැයිස්තුවෙන් ඉවත් කිරීම තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධන වියදම් රු.මිලියන 176ක් වියදම් කිරීමෙන් පසු අමාත්‍යාංශය විසින් යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යාපෘති අර්ධ වශයෙන් නිම කර අවසන් කරන ලදි. එම නිසා, ව්‍යාපෘතිය මත දරන ලද වියදම් නිශ්කාරය වියදමක් බවට පත්විය. | අදහස් දක්වා නොමැත. | නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2019 අගෝස්තු 03 දින අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම යටතේ 2019 නොවැම්බර් 11 දින සැලසුම් හා ප්‍රසම්පාදන උපදේශන සමාගම සේවයේ යොදවා තිබුණි. මෙම ගිවිසුමට අමුණා තිබුණු වැඩ සැලැස්මට අනුව, සියලුම කටයුතු 2020 දෙසැම්බර් 31 දිනට පෙර නිම කළ යුතු අතර එහි ප්‍රතිඵල ව්‍යාපෘති කළමණාකරන ඒකකය වෙත භාරදිය යුතුය. කෙසේවෙතත්, ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී උපදේශන සමාගම ප්‍රමාණවත් ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අවසන් ගෙවීම සිදු කිරීමට පෙර කරන ලද වැඩ ඇගයීම සිදු කළ යුතුය. |